**බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය**

**7 ශ්‍රේණිය - නර්තනය**

## ➢ වන්නම්වල සමාජ සංස්කෘතික පසුබිම

- උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයටම පොදු වූ වන්නම් මුල් යුගයේ රචනා වී ඇත්තේ ගායනය සඳහා ය.
- උඩරට හා සබරගමු වන්නම් විනෝදාස්වාදය සඳහා රචනා වී ඇති අතර පහතරට වන්නම් දෙවුන්දර උපුල්වන් (විෂ්ණු) දෙවියන් කෙරෙහි භක්තිය පෙරදැරි කොටගෙන ශාන්තියක් අපේක්ෂාවෙන් රචනා වී ඇත.
- ප්‍රස්තුතයෙන් කියවෙන අදහස ප්‍රකාශවීමත්, සම්ප්‍රදායික වන්නම් නර්තනයේ දී සිදු නොකරයි.

වන්නම් ව්‍යුහය

- උඩරට 18
  - බෙරපදය
  - තානම
  - කවිය
  - කස්තිරම
  - සීරුමාරුව
  - අඩව්ව
- සබරගමු 24
  - බෙරපදය
  - තානම
  - කවිය
  - කලාසම
  - අඩව්ව
- පහතරට (සින්දු වන්නම) 32
  - බෙර පදය
  - තානම
  - කවිය
  - ඉරට්ටිය

➢ උඩරට තුරඟා වන්නම : සිදුහත් කුමරු ගිහිගෙය අතහැර කන්තක නම් අසුපිට නැගී අනෝමා ගං තෙරෙන් එතෙර වී පැවදි බව ලබා ගත් අයුරු විස්තර වෙයි.

Balangoda Zonal E

## ➢ තලමල වරුණ කවිවල පසුබිම

- තල ගසේ ආයු කාලය අවසන් වන මොහොතේ තලමල පිපෙන බව ගැමි සමාජය තුළ පවතින විශ්වාසයකි.
- තලමලෙහි වර්ණය, ස්වභාවය, ප්‍රමාණය හේතු කොටගෙන තලමල වරුණ කවි ගැමියන් විසින් පබදින්නට හේතුවන්නට ඇත.
- නමුත් තලමල පිබිදීම එම ගමට අසුබ ලක්ෂණයක් යැයි ගම්මුන්ගේ මතයයි.
- එනිසා එදා ගැමියන් තලමල කපා ගමෙන් ගෙනයාමේ දී එයට ගෞරව පිණිස හිසමත තබාගෙන රැගෙන ගිය බව කවිවලින් මතු කර දක්වයි.



තලමල

Balangoda Zonal Education

සැකසුම ඃ සිතාරා පවිත්‍රානි මිය

ර/ විද්‍යාකර මහා විද්‍යාලය